# Model Paper

First Year (100 Level) Examination in Bachelor of Arts (External New Syllabus)
(April 2017)

## ECNE 101 Introduction to Economics

Answer **Four** questions only

The total number of questions in this paper is 06

each question 25 marks.

( Three Hours )

1. (a). ආර්ථික පිරිවැය හා ගිණුම්කරණ පිරිවැය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)

   (b). කෙටිකාලයේදී ආන්තික පිරිවැය වක්‍රය, සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රය, හා සාමාන්‍ය මුලු පිරිවැය වක්‍රය සාමාන්‍යයෙන් U අකුරක හැඩය ගන්නේ මන්ද? (ලකුණු 6)

   (c). කෙටිකාලයේදී නිතරම සාමාන්‍ය පිරිවැය වක්‍රවල අවම ලක්ෂය හරහා ආන්තික පිරිවැය වක්‍ර ගමන් කරන්නේ ඇයි? (ලකුණු 5)

2. (a). "පූර්ණ තරඟකාරී ආයතනයක් 'මිල ගනුවෙකු' වන අතර වෙළෙඳපල තීරණය වී ඇති මිලක් යටතේ භාණ්ඩයෙන් ඕනෑම ප්‍රමාණයක් අලෙවි කිරීමට හැකිය" පූර්ණ තරඟකාරී ආයතනක් හා සම්බන්ධ උපකල්පන දක්වමින් මෙම කියමන විස්තර කරන්න. (ලකුණු 9)

   (b). පූර්ණ තරඟකාරී ආයතනයක කෙටිකාලීන සැපයුම් වක්‍රය විස්තර කරන්න. (ලකුණු 6)

3. (a). "ඒකාධිකාරී ආයතනයක් වූ පමණින් සෑම විටම ආර්ථික ලාභ ලබන බවට සහතික විය නොහැක." ඇයි? සුදුසු රූප සටහන් යොදාගනිමින් මෙම කියමන පැහැදිලි කරන්න. (ලකුණු 8)

   (b). සුදුසු රූපසටහන් භාවිත කරමින් පූර්ණ තරඟකාරී ආයතනයක හා ඒකාධිකාරී ආයතනයක දිගුකාලීන සමතුලිතය සංසන්දනාත්මකව වෙන් කොට දක්වන්න. (ලකුණු 7)

4. විවෘත ආර්ථිකයක් පිළිබඳ පහත සඳහන් තොරතුරු ඔබට සපයා ඇත (රුපියල් මිලියන).

| | | |
|---|---|---|
| පාරිභෝජන ශ්‍රිතය | C | $= 80 + 0.8\, Y_d$ |
| පෞද්ගලික ආයෝජන | I | = 85 |
| රජයේ වියදම් | G | = 80 |
| ඍජු බදු ශ්‍රිතය | T | = 0.1Y |
| අපනයන | X | = 70 |
| ආනයන | M | = 25 |

(i) ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම් මට්ටම (Y) තීරණය කරන්න. (ලකුණු 4)

(ii) ආදායම් ගුණකයේ අගය ගණනය කරන්න. (ලකුණු 2)

(iii) පෞද්ගලික ආයෝජන (I) රු.මිලියන 95 දක්වා ඉහළ යන්නේ නම්, ආර්ථිකයේ නව සමතුලිත ආදායම් මට්ටම කොපමණද? (ලකුණු 3)

(iv) බදු අනුපාතය (t) 0.15, (T = 0.15Y) දක්වා වැඩි වූයේ යැයි සිතන්න. මෙහිදී ආදායම් ගුණකයේ අගය වෙනස් වන්නේ කෙසේද? (ලකුණු 3)

(v) රජයේ වියදම් රජයේ බදු ආදායමට සමාන වේ නම් (G = T), ආර්ථිකයේ යම් ගුණක ප්‍රතිවිපාකයක් ඇති වේද? එසේ වන්නේ නම් ඒ ඇයි? (ලකුණු 3)

5. a. වාණිජ බැංකුවල මුදල් මැවීමේ ක්‍රියාවලිය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 4)

b. තැන්පතු ගුණකය යනු කුමක්ද? එය සල්ලි සංචිත අනුපාතය සමඟ සම්බන්ධ වන්නේ කෙසේද? (ලකුණු 3)

c. ඔබ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩල සාමාජිකයෙකු යයි සිතන්න. ආර්ථිකය දිගු කලක සිට තියුණු උද්ධමනීය තත්වයක පසු වේ. මෙම තත්වය යටතේ (a) සල්ලි සංචිත අනුපාතිකය, (b) බැංකු අනුපාතිකය, සහ (c) විවට වෙළෙඳපල කටයුතු යන උපකරණවල කුමන වෙනස්කම් ඇති කිරීමට ඔබ නිර්දේශ කරන්නේද? මෙම එක් එක් වෙනස්කම් වාණිජ බැංකු සංචිතවලට, මුදල් සැපයුමට, පොලී අනුපාතවලට හා සමාහාර ඉල්ලුමට බලපෑ හැකි ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 8)

6. පහත සඳහන් ඕනෑම සංකල්ප යුගළ තුනක වෙනස් කම් දක්වන්න.

a. පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදක අතිරික්තය
b. හීනවන ආන්තික ඵලදා නීතිය හා පරිමානානුකූල ඵල නීතය
c. ආන්තික පරිභෝජන නැඹියාව (MPC) හා සාමාන්‍ය පරිභෝජන නැඹියාව (APC)
d. ආදායම් ගුණකය හා තැන්පතු ගුණකය
e. මුදල් පදනම හා මුදල් සැපයුම

(ලකුණු 15)